"විශිෂ්ඨ රාජ්‍ය සේවාවක් සඳහා ඇප කැපවෙමු"
# ප්‍රධාන ලේකම් කාර්යාලය - බස්නාහිර පළාත
# பிரதான செயலாளர் அலுவலகம் - மேல் மாகாணம்
# OFFICE OF THE CHIEF SECRETARY - WESTERN PROVINCE

204, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, බත්තරමුල්ල.
204, டென்சில் கொப்பேகடுவ மாவத்தை, பத்தரமுல்ல.
204, Denzil Kobbekaduwa Mawatha, Battaramulla.

ප්‍රධාන ලේකම් / பிரதான செயலாளர் / Chief Secretary
දුරකථන / தொலைபேசி / Telephone - 011 - 2092599
ෆැක්ස් / பெக்ஸ் / Fax - 011 - 2092601
ඊ-මේල් / மின்னஞ்சல் / E-mail - chiefsecretary@wpc.gov.lk
පොදු දුරකථන / தொலைபேசி இலக்கம் / General Telephone 011 - 2093000

ISO 9001 ISO/IEC: 17021 QMS-001-01

මගේ අංකය / எனது இலக்கம் / My No. CSWP/ADM/18-38/FI/01-2022 ඔබේ අංකය / உமது இலக்கம் / Your No. දිනය / திகதி / Date 2022.05.

ආණ්ඩුකාර ලේකම්,

ආණ්ඩුකාරවර කාර්යාලය,

බස්නාහිර පළාත.

**මධ්‍යම රජයේ විවිධ අමාත්‍යාංශ වෙතින් ලැබෙන චක්‍රලේඛ (මූල්‍ය චක්‍රලේඛ හැර) බස්නාහිර පළාතට අදාල කර ගැනීමේ කමිටු තීරණ සඳහා අනුමැතිය ලබා ගැනීම**

උක්ත කරුණට අදාලව පහත සඳහන් රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ පවතින ආකාරයෙන්ම පළාත් රාජ්‍ය සේවයට අදාල කර ගැනීම සුදුසු වන බව 2022.05.27 දින රැස්වූ චක්‍රලේඛ පළාතට අදාල කර ගැනීමේ කමිටුව විසින් නිර්දේශ කර ඇත.

02. එම නිර්දේශය මවිසින්ද නිර්දේශ කර ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය ලබා ගැනීම සඳහා මේ සමග කාරුණිකව ඉදිරිපත් කරමි.

| අනු අංකය | දිනය හා චක්‍රලේඛ අංකය | විස්තරය |
|---|---|---|
| 01 | 2018.11.12<br>රා.සේ.කො.සභා චක්‍රලේඛ 04/2018 | දීප ව්‍යාප්ත සේවාවන් වල සේවා ව්‍යවස්ථා සංග්‍රහයෙහි විධිවිධාන අනුව පශ්චාත් උපාධි අවශ්‍යතා සම්පූර්ණ කිරීම. |
| 02. | 2021.06.30<br>රා.සේ.කො.සභා චක්‍රලේඛ 01/2021<br>2021.08.02<br>රා.සේ.කො.සභා චක්‍රලේඛ 01/2021(1) | දීප ව්‍යාප්ත සේවාවන් හි විශේෂ ශ්‍රේණියට උසස්වීම් ලද නිලධාරීන් විශේෂ ශ්‍රේණියේ තනතුරුවලට පත් කිරීම. |

ඩබ්.එම්.දයාවතී,
නියෝජ්‍ය ප්‍රධාන ලේකම්(පාලන).

අත් කළේ :- ජේ.එම්.සී.ජයන්ති විජේතුංග,
ප්‍රධාන ලේකම්,
බස්නාහිර පළාත.

දුරකථන / தொலைபேசி / Telephones: 011-2136600, 011-2136650
ලේකම් / செயலாளர் / Secretary: 011-2136602
ෆැක්ස් / தொலைநகல் / Fax: 011-2876169, 011-2876181
විද්‍යුත් තැපැල / மின் - அஞ்சல் / E - mail: info@psc.gov.lk
වෙබ් අඩවිය / இணையத்தளம் / Website: www.psc.gov.lk

රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලය
அரசாங்க சேவை ஆணைக்குழு அலுவலகம்
OFFICE OF THE PUBLIC SERVICE COMMISSION

අංක 1200/9, රජමල්වත්ත පාර, බත්තරමුල්ල
இல. 1200/9, இராஜமல்வத்தை வீதி, பத்தரமுல்லை
No. 1200/9, Rajamalwatta Road, Battaramulla

මගේ අංකය / எனது இல. / My No.: PSC/EST/09-03/ 08/2019
ඔබේ අංකය / உமது இல. / Your No.:
දිනය / திகதி / Date: 2021.06. 30

රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ : 01/2021

සියලුම අමාත්‍යාංශ ලේකම්වරුන්,

දෙපාර්තමේන්තු ප්‍රධානීන්,

<u>දීප ව්‍යාප්ත සේවාවන්හි විශේෂ ශ්‍රේණියට උසස්වීම් ලද නිලධාරීන් විශේෂ ශ්‍රේණියේ තනතුරු වලට පත් කිරීම</u>

01.දීප ව්‍යාප්ත සේවාවන්හි විශේෂ ශ්‍රේණියට ඉදිරියේදී උසස්වීම් ලබන නිලධාරීන් එම සේවයේ විශේෂ ශ්‍රේණිය යටතේ අනුමත කර ඇති තනතුරකට පත්කරනු ලබන අවස්ථාවකදී එම පත්වීම් ලිපිය ලද දින සිට සති 02ක කාලයක් තුළ නව තනතුරේ වැඩ භාර ගැනීමට කටයුතු කළ යුත්තේය. එලෙස රාජකාරි සඳහා සති 02ක් තුළ වාර්තා නොකරනු ලබන නිලධාරීන්ගේ විශේෂ ශ්‍රේණියේ උසස්වීම අවලංගු කිරීමට කටයුතු කරනු ලැබේ.

02. දීප ව්‍යාප්ත සේවාවන්හි විශේෂ ශ්‍රේණියට උසස්වීම් ලැබ ඇති නමුත් පහළ ශ්‍රේණියක තනතුරක දැනට සේවය කරනු ලබන විශේෂ ශ්‍රේණියේ නිලධාරීන්, සේවා අවශ්‍යතාවය පරිදි එක් එක් සේවාවන්හි විශේෂ ශ්‍රේණිය යටතේ අනුමත කර ඇති තනතුරු සඳහා 2021.08.31 දිනට පෙර පත්කිරීමට එම සේවාවන්හි පරිපාලන බලධරයන් විසින් අවශ්‍ය කටයුතු කළ යුතුය.

03. දීප ව්‍යාප්ත සේවාවල විශේෂ ශ්‍රේණියේ තනතුරකට දැනටමත් පත් කර ඇති නමුත් මේ දක්වා විශේෂ ශ්‍රේණියේ තනතුරෙහි රාජකාරි සඳහා වාර්තා නොකළ නිලධාරීන්ට විශේෂ ශ්‍රේණියේ තනතුරෙහි රාජකාරි සඳහා වාර්තා කිරීමට 2021.07.31 දක්වා කාලය ලබා දී එදින සිට ලිත් මසක් ඇතුළත තනතුර භාර නොගන්නා නිලධාරීන් ස්වකැමැත්තෙන් තනතුර අතහැරගිය නිලධාරීන් ලෙස සලකා ඉදිරි කටයුතු කිරීමට පරිපාලන බලධරයන් විසින් කටයුතු කළ යුතුය.

2/

04. නව තනතුරේ වැඩ භාර ගැනීමට හැකි වන පරිදි ඉහත අනු අංක 01, 02 හා 03 යටතේ සඳහන් නිලධාරියකු නිදහස් කිරීමට කටයුතු කිරීම සියළුම ආයතන ප්‍රධානීන්ගේ වගකීම වන්නේය. එලෙස නිලධාරියකු විධිමත් පරිදි නිදහස් නොකිරීම නිසා ඇති විය හැකි ගැටළු සම්බන්ධයෙන් නිලධාරියා නිදහස් නොකිරීමට කටයුතු කරනු ලබන අදාළ ආයතන ප්‍රධානීන් පෞද්ගලිකවම වගකිව යුත්තේය.

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියමය පරිදි,

එම්.ඒ.බී.දයා සෙනරත්
ලේකම්
රාජ්‍ය සේවා කොමිෂන් සභාව